# ගොවි ජනපද ව්‍යාපාරවල ජනපදිකයින් වර්තමානයේ මුහුණ දෙන සමාජ ආර්ථික ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

## (පදවිය ගොවි ජනපදය ඇසුරෙන්.)

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති (සමාජ විද්‍යාව) පාඨමාලාවේ අවශ්‍යතාවයක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කරන ස්වාධීන පර්යේෂණ නිබන්ධයකි.

විභාග අංකය : FGS/S/MSSc/2006/12

නම: අයි. පී. එම්. සෙව්වන්දි චන්ද්‍රසෝම

විභාග වර්ෂය : 2010 ඔක්තෝම්බර්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
03 OCT 2013
UNIVERSITY OF KELANIYA

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 841 |
| වර්ග අංකය: | |


සමාජ විද්‍යා අධ්‍යයන අංශය

කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය

## නිබන්ධ සාරාංශය


ගොවි ජනපද ඉතිහාසයෙහි අඩිතාලම සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ ආරම්භය එනම්, ක්‍රි.පූ. 6 වැනි සියවස ජනාවාසකරණයේ සිටම ක්‍රමයෙන් විකාශනය වූවකි. එය යටත්විජිත පාලනයේ සිටම නිදහස ලබන කාලය දක්වාත් ඉන්පසුව රජය ගෙන ගිය කෘෂිකාර්මික ප්‍රතිපත්ති මගින් ද  මැනවින් වටහා ගත හැකි වේ. කෙසේ වුවද 1930 ගණන්වල ආරම්භ වූ ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරය සඳහා අද වනවිට දශක ගණනාවක් ඉක්මවා ඇති අතර ඒ වටා වර්තමානයේ සමාජීය ගැටලු රාශියක් පැන නැගි ඇති බව පැහැදිලිය. සාම්ප්‍රදායික ගම්මානවල තත්වයට වඩා ගොවි ජනපදවල මෙම සමාජීය ගැටලු ඉහළ මට්ටමක පවතී. මෙම තත්වය පදනම් කරගෙන ගොවි ජනපදවල ජනපදවාසීන් වර්තමානයේ මුහුණ දෙන සමාජ, ආර්ථික ගැටලු පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

මෙහිදී පර්යේෂණ ක්‍රියාවලිය සමීක්ෂණයක් (Survey Method) ලෙස සැලසුම් කරන ලදී. එයට හේතුව වූයේ පර්යේෂණ කාර්යයේදී ප්‍රමාණාත්මක දත්ත වැඩි ප්‍රමාණයක් එක්රැස් කර ගැනීමට පැවති බැවින් හා ඉතා කෙටි කාලයකින් මතුපිට දත්ත වැඩි ප්‍රමාණයක් රැස්කර ගැනීමට හැකියාව ලැබෙන බැවිනි. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන ලදී. ප්‍රශ්නාවලි ක්‍රමය හරහා ලබා ගැනීමට නොහැකි වූ ඇතැම් තොරතුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Interview) තුළින් ලබා ගන්නා ලදී. ඊට අමතරව නිරීක්ෂණය (Obeservation) ද උපයෝගී කර ගන්නා ලදී. මේ පිළිබඳව නිබන්ධනයෙහි පළමු පරිච්ඡේදයෙන් විස්තර කොට ඇත.

පර්යේෂණ නියැදිය ලෙස තෝරා ගන්නා ලද්දේ උතුරු මැද හා උතුරු නැගෙනහිර යන පළාත් දෙකටම අයත් ප්‍රදේශ දෙකකින් සමන්විත වන පදවිය ගොවි ජනපදයයි. එම ගොවි ජනපදය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකකින් සමන්විත වේ. එනම්, පදවිය හා පදවි ශ්‍රීපුර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය වශයෙනි. එයින් පදවි ශ්‍රීපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියලුම ග්‍රාමසේවක තුලාන ආවරණය වන පරිදි පුද්ගලයින් 150 දෙනෙකුගේ නියැදියක් තෝරා ගන්නා ලදී.

මෙම නිබන්ධනයේ දෙවෙනි පරිච්ඡේදයෙන් ගැමි සමාජය හා ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගම පිළිබඳව විග්‍රහ කරනු ලබයි. එහිදී ගැමි සමාජය පිළිබඳ පුළුල් විග්‍රහයක් න්‍යාය හා සංකල්ප ඇතුළත්ව ඉදිරිපත් කෙරේ. මෙහිදී ප්‍රමුඛ පෙළේ මානව විද්‍යාඥයින්ගේ අදහස්, සංකල්ප හා නිර්වචන ගෙනහැර දක්වා ඇත. එම පරිච්ඡේදය තුළදී ම ශ්‍රී ලංකාවේ ගම සංවිධානය වූ ආකාරය මනාව විග්‍රහ කර ඇත.

තුන්වන පරිච්ඡේදය තුළින් සාම්ප්‍රදායික කෘෂිකාර්මික සමාජ රටාවේ වෙනස්වීම් පිළිබඳව පුළුල්ව විග්‍රහ කොට දක්වයි. එහිදී ශ්‍රී ලංකාවේ ගම විපර්යාසයට ලක්වීමට බලපෑ හේතු සාධක යටත්විජිත යුගයේ සිටම හා නිදහසින් පසු අවධිය තෙක්ම විග්‍රහ වේ.

හතරවන පරිච්ඡේදය තුළින් ජනපදකරණය හා සමාජ සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. මෙම පරිච්ඡේදයේ මුල් කොටසින් ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරය ආරම්භය හා විකාශනය පිළිබඳව කරුණු දක්වා ඇත. එම පරිච්ඡේදයේ දෙවන කොටසින් පදවිය ගොවි ජනපදයේ භූගෝලීය පිහිටීම, පදවිය ගොවි ජනපදයේ ඓතිහාසික පසුබිම, නියැදියේ ප්‍රජා විද්‍යාත්මක පසුබිම පිළිබඳව කරුණු මැනවින් විග්‍රහ කොට ඇත.

මෙම නිබන්ධනයෙහි පස්වන පරිච්ඡේදය තුළින් පර්යේෂණ ගැටලුවට අදාළ දත්ත විශ්ලේෂණය සිදුකරනු ලබයි. එහිදී ජනනපදවාසීන් වර්තමානයේ මුහුණ දෙන සමාජ, ආර්ථික ගැටලු පිළිබඳව සමීක්ෂණය තුළින් ලබා ගත් දත්ත ආශ්‍රයෙන් විග්‍රහ කොට දක්වයි. මෙම පරිච්ඡේදය අනු මාතෘකා කිහිපයක් ඔස්සේ විස්තර කොට ඇත. ඒ අනුව අධ්‍යාපන ගැටලු, පානීය ජල ගැටලුව, සෞඛ්‍ය හා සනීපාරක්ෂක ගැටලු, දරිද්‍රතාවය, ප්‍රවාහන ගැටලු, විරැකියාව, සන්නිවේදනය පිළිබඳ ගැටලු, ඉඩම් කැබලි වීම හා පොදු පහසුකම් අවම වීම ආදී ගැටලු රැසක් පිළිබඳව සමාජ විද්‍යාත්මකව පර්යේෂණය මගින් ඒකරාශී කර ගන්නා ලද දත්ත හරහා ක්‍රමානුකූලව විග්‍රහ කරනු ලබයි.

හයවන පරිච්ඡේදය තුළින් සාරාංශය, නිගමන හා යෝජනා දක්වා ඇත. එහිදී මෙම ගොවි ජනපදයේ සිදුවෙමින් පවතින ගැටලු සහගත වෙනස්කම් පාලනය කිරීමට ඉදිරිපත් කළ හැකි යෝජනා දක්වා ඇත.

නිබන්ධනය අවසානයෙහි සමීක්ෂණය සඳහා යොදා ගත් ප්‍රශ්නාවලිය හා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ඉදිරිපත් කර ඇත.